# 7 සරු පොළොවක් අපට ඇතේ

වෙරළ වටා මුතුපර වැටියයි
ඉන්දිය සයුරේ මුතු ඇටයයි

පාට පාට මැණික් ජාති
පසට යටින් කැටි වේ
රත්නදීප පොළොව තුළින්
ධන නිධාන මතු වේ



මහවැලි නිල්වලා ගඟයි
කළු වලවේ කැලණි ගඟයි
ගමින් ගමට
ගලා ගොසින්
ගොඩයි මඩයි පොහොර කරයි

පලා පැහැය හැම කල්හි ම
රැඳී දිලෙන පොළොවේ
ඉවත දමන දඬුව වුව ද
දලු ලා යළි පැළ වේ



සීගිරියේ ලෙන් දොරකඩ
සිටින සුරංගනාවෝ
දෝත පුරා මල් අරගෙන
අපට සුවඳ ගෙනාවෝ

නිල් පලසක් එළුවා සේ
රුහුණු රටේ වෙල් යායයි
පිය ගැට පෙළ කැපුවා සේ
උඩරට පොඩි ලියදි පෙළයි



දුන්හිඳ දියලුම ඇලී
ගලින් ගලට හැලී හැලී
සිහින් සිනිඳු දේදුනු මැද
මුතු වැල් වරුසා වසී

ඉරු දෙව් මුහුදින් ඇදී
සමනොළ කන්දට වඳී
එතකොට මුළු ලංකාව ම
දිලිහෙයි ලස්සන වෙවී

සරු පොළොවක් අපට ඇතේ
මහගම සේකර



## අවබෝධය

1. කවි පන්තිය ඇසුරෙන් උත්තර දෙන්න.

   i. පොළොව තුළින් මතු වන ධන නිධාන මොනවා ද?

   ii. කවි පෙළෙහි සඳහන් ගංගාවල නම් කියන්න.

   iii. දෝත පුරා මල් අරගෙන සුවඳ ගෙනෙන්නේ කවුද?

   iv. ලංකාව හැඳින්වීමට කවි පන්තියේ යොදා ඇති වෙනත් නම් මොනවා ද?

   v. "ඉවත දමන දඬුව වුව ද දලු ලා යළි පැළ වේ." මින් අදහස් කරන්නේ කුමක් ද?

## ක්‍රියාකාරකම 1

හිස්තැන්වලට සුදුසු අකුර වරහන් තුළින් තෝරන්න.

i. වෙර...... වටා මුතු පර වැටිය යි. (ල, ළ)

ii. රත්නදීප පො......ව තුළින් ධන නිධාන මතු වේ. (ලො, ළො)

iii. දි......හෙයි ලස්සන වෙවී (ලි, ළි)

iv. ප...... පැහැය හැම කල්හි ම (ලා, ළා)

v. දළු ලා යළි පැ..... වේ. (ල, ළ)

vi. පියගැට පෙ...... කැපුවා සේ (ල, ළ)

## ක්‍රියාකාරකම 2

(අ) කොටසේ දැක්වෙන ස්ථාන සමාන කර ඇත්තේ මොනවාට දැයි (ආ) කොටසින් තෝරා යා කරන්න.

| (අ) | (ආ) |
|---|---|
| රුහුණු රටේ වෙල්යාය | ඉන්දිය සයුරේ මුතු ඇටය |
| උඩරට පොඩි ලියදි පෙළ | මුතුවැල් වරුසා |
| දුන්හිඳ දියලුම ඇලී | නිල් පලස |
| ලංකාව | පියගැට පෙළ |

## ක්‍රියාකාරකම 3

'මගේ රට' ගැන කවියක් නිර්මාණය කරන්න.